සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

(01) මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම

පැ දෙකයි

එක් කොටසකින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

I වන කොටස - මුදල් රෙගුලාසි

1. (i) "වොරන්ට් බලපත්‍රයක්" යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) වොරන්ට් බලපත්‍ර වර්ග පහක් නම් කරන්න.

2. (i) මු.රෙ. 102 ප්‍රකාරව නැතිවීම්/හානි යන්නට ඇතුළත් වන නැතිවීම්/හානි වර්ග පහක් සඳහන් කරන්න.
   (ii) සෑම දෙපාර්තමේන්තුවක් විසින් ම හානි පිළිබඳ වාර්තා කිරීම සඳහා හානි ලේඛනයක් පවත්වා ගත යුතුය. එවැනි හානි ලේඛනයක ඇතුළත් වියයුතු කරුණු දහයක් සඳහන් කරන්න.

3. සහතික කරන ලද වවුචරයක් වෙනුවෙන් ගෙවීම් කිරීමට බලයලත් නිලධාරියකු විසින් තම ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු සඳහන් කරන්න.

II වන කොටස - කාර්යාල ක්‍රම

4. (i) රජයේ නිලධාරියකු තමන්ගේ නිත්‍ය රැකියාවට හෝ ධුරයට හෝ පරිබාහිර වූ සේවාවන් ඉටු කිරීම සම්බන්ධයෙන් වූ නියමයන් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් ඇති නිලධාරියකුට ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් දෙනු ලබන අනුග්‍රහයන් මොනවා ද?

5. (i) නිල තත්ත්වයෙන් රජයේ නිලධාරියකුට විරුද්ධව පවරා ඇති නඩුවක දී වගඋත්තර කියා සිටීම සම්බන්ධයෙන් දැන සිටිය යුතු කරුණු මොනවා ද?
   (ii) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන රජයේ සේවකයකුට විශ්‍රාම පූර්ව නිවාඩු ලබාදෙන ආකාරය පැහැදිලි කරන්න.

6. 'රේඛීය සංවිධානයක්' යනු කුමක් දැයි සඳහන් කර මෙවැනි සංවිධාන ක්‍රමයකින් ඇති වන වාසි පැහැදිලි කරන්න.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

## (02) ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්

පැ දෙකයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

1. කාන්තා අයිතිවාසිකම් සුරැකීම උදෙසා ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය මගින් ලබා දෙන දායකත්වය පිළිබඳ විමසීමක් සිදු කරන්න.

2. ශ්‍රී ලාංකේය සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ලක්ෂණ, කලාපයේ අනෙක් රටවල්වල ලක්ෂණ සමග සසඳමින් ඒවායේ ඇති සම විෂමතා පිළිබඳව විමසීමක් කරන්න.

3. "කාන්තා හිංසනය සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීම නීතිමය විසඳුමකින් පමණක් සිදු කළ හැක්කක් නොවේ."
   මෙම ප්‍රකාශය පිළිබඳ ඔබ දරන මතය හේතු සහිතව පැහැදිලි කරන්න.

4. "ගත වූ සියවස තුළ දී ශ්‍රී ලාංකික පවුල නවීකරණය වී ඇතත්, කාන්තා භූමිකාව සහ ඇය පිළිබඳව දරන ආකල්ප තවදුරටත් සාම්ප්‍රදායික බවක් උසුලයි."
   මෙම ප්‍රකාශය පිළිබඳව ඔබගේ මතය ඇසුරෙන් නූතන පවුල් සංස්ථාව මුහුණදෙන ගැටලු සාකච්ඡා කරන්න.

5. කාන්තා වැඩ පරිමාව රටක ආර්ථික ක්‍රියාවලියට සිදු කරන දායකත්වය පිළිබඳව විමසන්න.

6. ළමා විය අහිමි වූ මව්වරුන් හා ඔවුන්ගේ දරුවන් මුහුණ දෙන ගැටලු කිනම් ස්වභාවයක් ගෙන ඇති දැයි විභාග කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

**(03) සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය**

පැ දෙකයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) ශ්‍රී ලාංකීය සමාජය සීඝ්‍ර පරිවර්තනයකට ලක් වෙමින් පවතී. මානසික ප්‍රශ්න ඇති වීමට තුඩු දෙන මෙහි ඇති සෘණාත්මක සමාජ හා සංස්කෘතික පරිවර්තන ලක්ෂණ පහක් උදාහරණ සපයමින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) නාගරිකකරණය, කාර්මිකකරණය, යාන්ත්‍රිකකරණය හා බටහිරකරණය යන එකිනෙකට සම්බන්ධිත සංකල්ප කෙටියෙන් නිර්වචනය කර ශ්‍රී ලංකාවේ වර්තමාන නාගරිකකරණය තුළ මෙම ලක්ෂණවලට උදාහරණ සපයන්න. *(ලකුණු 10 යි)*

2. (i) "පවුල යනු සමාජයේ ඉතාම වැදගත් සමාජ සංස්ථාව වේ." පවුලේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම මතය පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) "වර්තමාන බොහෝ සමාජ සම්බන්ධතා ප්‍රශ්නවලට සමාජානුයෝජන ක්‍රියාවලියේ දුර්වලතා හේතු වී ඇත." සමාජානුයෝජනය යනු කුමක් දැයි නිර්වචනය කරමින් මෙම අදහසට ඔබ එකඟ වන්නේ දැයි හේතු දක්වන්න. *(ලකුණු 10 යි)*

3. (i) "සංස්කෘතියක් එහි මතුපිට ලක්ෂණවලින් හඳුනාගත හැකි ය." සංස්කෘතියක මතුපිට ලක්ෂණ දහයක් නම් කරමින් මේ සම්බන්ධයෙන් කරුණු දක්වන්න. *(ලකුණු 10 යි)*

   (ii) විශ්වාස, සාරධර්ම (වටිනාකම්) හා ආකල්ප නිර්වචනය කර සංස්කෘතියට ඒවායේ ඇති සම්බන්ධකම පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

4. (i) "පුද්ගලයින්ගේ වර්තමාන පෞරුෂත්වය අතීත පෞරුෂත්ව සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි." මෙම ප්‍රකාශය න්‍යායාත්මක පදනමක් සහිතව පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) "වර්තමාන බොහෝ මානසික ප්‍රශ්නවලට දුර්වල පෞරුෂත්ව සංවර්ධනය හේතු වේ." මෙම අදහසට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. *(ලකුණු 10 යි)*

5. (i) "උපදේශන ක්‍රියාවලිය පෞරුෂත්වය සංවර්ධන ක්‍රියාවලියකි." උපදේශනය නිර්වචනය කරමින් මෙම අදහස පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) සමාජ සංජානනය යනු කුමක් දැයි විස්තර කර එය මානසික ගැටලු ඇතිවීමට බලපාන ආකාරය සංජානන දුර්වලතා පදනම් කරගෙන කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

6. (i) කාන්තා හිංසනය හා ළමා අපයෝජනය (Child Abuse) යනු කුමක් දැයි කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදු වන ගැටලු හා අතවර දිනෙන් දින වැඩිවන බව පුවත්පත් වාර්තාවලින් පෙන්නුම් කරයි. එවැනි අතවර පහක් නම් කර, ඒ සඳහා බලපාන පවුල හා සමාජ පරිසරය ආශ්‍රිත සාධක පහක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

7. (i) "කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි හිංසන වැඩිවීමට මාධ්‍ය මගින් ඊට ලබා දෙන ප්‍රචාරය හේතු වන බව ඇතැමුන්ගේ මතයයි." මීට ඔබ එකඟ වන්නේ දැයි හේතු සහිතව විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) ළමා හා කාන්තා හිංසන පිළිබඳ උපදේශන ක්‍රියාවලියේ දැනට ඇති දුර්වලතා පහක් නම් කර, ඊට අදාළ උපදේශන ක්‍රියාවලිය දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. *(ලකුණු 10 යි)*

***